Article 12 (1)
12 (1D).

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2019 - 03 - 18 |
|---|---|---|---|

පැමිණිලි පාර්ශවය :- කේ.ඒ.එච්.එම්. වික්‍රමසිරි මහතා,
BL 13,3 වන මාවත,
අම්පාර.

වගඋත්තර පාර්ශවය :- 01. එස්.කේ. සමරනායක මයා,
විදුහල්පති,
අම්/ඩී.එස්. සේනානායක ජාතික පාසල,
අම්පාර.

02. එම්.කමනි පෙරේරා මිය
අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් කටයුතු ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය :- **HRC/AM/78/17/S/ED**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, තමා අම්පාර අධ්‍යාපන කලාපයේ දමන උක්සිරිපුර විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස සේවය කරන බවත්, තම දියණිය 2016 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට ලකුණු 138 ක් ලබා ගත් බවත්, ඒ අනුව 2016/12/24 වන දින ලියාපදිංචි තැපැල මගින් අම්පාර ඩී.එස්.සේනානායක මධ්‍ය මහා විද්‍යාලයට අධ්‍යාපන සේවක පදනමින් 6 ශ්‍රේණියට ඇතුලත්වීමට අයදුම්පත් යොමුකළ බවත්, නමුත් තමාව සම්මුඛ පරීක්ෂණයකට හෝ නොකැඳවූ බවත් සඳහන් කර ඇත. ඒ පිළිබඳව පාසලේ විදුහල්පතිවරයාගෙන් විමසූ විට ඔහු තම පාසල් ගුරුභවතුන් 07 දෙනෙකුගේ දරුවන් සිටින නිසා අනෙක් අයට සම්මුඛ පරීක්ෂණයට කැඳවීමක් නොකරන බව දැන්වූ බවත් ඒ පිළිබඳව නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) ගෙන් විමසූ විට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන
ලේකම්
ක්ෂණික 011-2505575
වෙබ්

විදුහල්පති විසින් 2008/37 (1) චක්‍රල්ඛනය උල්ලංඝනය කරමින් සිසුන් බඳවා ගැනීමට කටයුතු කර ඇති බව දැන්වූ බවත් සඳහන් කර ඇත.
එසේම ඒ සම්බන්ධයෙන් තමා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යක්ෂකට දැනුවුවද ඒ සඳහා තමාට පිළිතුරක් ලැබී නොමැති බවත් පාසල විසින් නිකුත් කළ ඉල්ලුම්පත අනුව එක් ගණයක් යටතේ ඉල්ලුම් කිරීමට සිදුවීම නිසා තමාට ආදි ශිෂ්‍ය පදනමින් ඉල්ලීමක් කිරීමට තිබූ අවස්ථාවද අහිමි වී ඇති බවත් දන්වා ඇත. එබැවින් මේ පිළිබඳව අවධානය යොමුකර සාධාරණයක් ඉටුකර දෙන ලෙසට කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම් :-**

විදුහල්පති අම්පාර ඩී.එස්.සේනානායක විදුහල විසින් කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ දරුවා 2016 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පැවති ශිෂ්‍යත්ව විභාගයේ දිස්ත්‍රික් සමත් කිරීමේ අවම ලකුණු සීමාවේ නොසිටීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණයට නොකැඳවූ බවත් එම වසරේ ශිෂ්‍යත්ව විභාගය සමත් කිරීමේ අවම ලකුණු සීමාව 152 ක් වුවද අදාළ දරුවා ලබා ගත් ලකුණු ප්‍රමාණය 132ක් බවත් දන්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යක්ෂිකා කමනී පෙරේරා මහත්මිය වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 6වන ශ්‍රේණියෙන් ආරම්භ වන අම්පාර ඩී.එස්.සේනානායක විදුහලේ 6වන ශ්‍රේණියෙහි සමාන්තර පන්ති 5ක් සඳහා පන්තියකට 45 සීමාව තුල සිසුන් 225ක් තෝරා ගැනීම සිදුකරන බවයි. මෙයින් 85%ක් හෙවත් සිසුන් 192ක් ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු මතද ඉතිරි 15% හෙවත් සිසුන් 33දෙනා 2008/37(1) දරණ චක්‍රලේඛයේ විධි විධාන වලට අනුකූලවද පහත පරිදි ශිෂ්‍යත්ව ලකුණු මතද තෝරා ගන්නා බවද සඳහන් කර ඇත. ඒ අනුව,

| | |
|---|---|
| ආදි ශිෂ්‍ය පදනම මත | - 75% |
| අධ්‍යාපන කාර්යය මණ්ඩල පදනම | -2.5% |
| සහෝදර පදනම මත | - 5% |

ලෙස තෝරා ගන්නා බවත් එසේ තෝරා ගනු ලබන්නේ මුල් වටයේදී ශිෂ්‍යත්වධාරීන් යොමු කිරීමේදී නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව වන 192 සම්පූර්ණ වන අවස්ථාවේ සිට සිසුවා ලබා ඇති ලකුණේ සිට පහලට ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව බවත් දක්වා ඇත.

එසේම අනුග්‍රහය තුල හිමිව ඇති සිසුන් 33 දෙනා වෙනුවෙන් විදුහල්පති විසින් 2008/37(1) දරණ චක්‍රලේඛනයේ විධි විධාන වලට අනුකූලව අනුමැතිය සඳහා ලේඛනයක් ඉදිරිපත් කර ඇති අතර එම ලේඛනයේ ආදි ශිෂ්‍ය හා සහෝදර පදනම යටතේ ඉදිරිපත් කරන ලද ශිෂ්‍ය නාම ලේඛන වලට අනුමැතිය ලබා දී ඇති බවත්, අධ්‍යාපන කාර්යය මණ්ඩල ගණය සඳහා විදුහල්පති විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයේ එම විදුහලේම සේවය කරන ගුරුවරුන් 07 දෙනෙකුගේ දරුවන්ගේ නම් පමණක් ඇතුලත් නාම ලේඛනයක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇතත් අනුමැතිය ලබා දී ඇත්තේ දිස්ත්‍රික් අනුව ලකුණු සීමාව ලබා ගත් එක සිසුවකු සඳහා පමණක් බවද සඳහන් කර ඇත. එහිදි එම පාසලේම ගුරුවරුන්ගේ දරුවන්ගේ නම් පමණක් යොමු කිරිමෙන් කලාපය තුල පාසල්වල සේවය කරන ගුරුභවතුන්ගේ සුදුසුකම් ලැබූ දරුවන් තම දක්ෂතාව මත ප්‍රදේශයේ පවතින එකම ප්‍රධාන ජාතික පාසලට ඇතුලත්වීමට ඇති අවස්ථාව අහිමි කිරිමක් වන නිසා එසේ සිදුකළ බවද සඳහන් කර ඇත. එසේම චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව අධ්‍යාපන කාර්යය මණ්ඩල පදනම යටතේ කලාපය තුල පාසල් වලින් ඉල්ලුම් කර ඇති වැඩිම ලකුණු ලැබූ සිසුන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විදුහල්පති වෙත දන්වා යවා ඇති බවද සඳහන් කර ඇත.

එසේම අධ්‍යාපන කාර්යය මණ්ඩලය සාමාජිකයකු වුවද ඔවුන්ගේ දරුවන් ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් සුදුසුකම් ලබා නොමැති අවස්ථාවකදී ලකුණු මත සුදුසුකම් ලැබූ සිසුන් පොරොත්තු ලේඛනයේ විදුහල අපේක්ෂාවෙන් සිටිම මත එම සිසුන්ට සිදුවන අවාසිදායක තත්ත්වය හේතුවෙන් විදුහල්පති විසින් ඉදිරිපත් කර ඇති අවම ලකුණු ලබා ඇති පාසලේ සේවය කරන ගුරුවරුන්ගේ දරුවන් කිසිවකු හෝ එම පාසලට යොමුකර නොමැති තත්ත්වයක් තුළ පැමිණිලිකරුට අසාධාරණයක් වී නොමැති බවද වැඩිදුරටත් දන්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරුගේ දරුවා 2016 පැවති 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේදී ලකුණු 138ක් ලබා ඇති අතර, අධ්‍යාන කාර්යය මණ්ඩල පදනම මත ඩී.එස්.සේනානායක ජාතික පාසලට 05 ශිෂ්‍යත්ව පරීක්‍ෂණයේ ප්‍රතිඵල මත සිසුන් 06 දෙනෙකු බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පැවැති බවත්, අධ්‍යාන කාර්යය මණ්ඩල පදනම මත ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් අතරින් පැමිණිලිකරුගේ දරුවා ලකුණු අනුපිළිවෙල මත හතරවන ස්ථානයේ පසුවන බවත් අනාවරණය වී ඇත. (පරීක්ෂණයේදී ඩී.එස්.සේනානායක විදුහලේ විදුහල්පති විසින් එය තහවුරු කර ඇත.)

පැමිණිලිකරුගේ දරුවාට වඩා 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් අඩු ලකුණු ලබා ගත් දරුවන්ද කුමන පදනමක් යටතේ හෝ මේ වන විට ඩී.එස්.සේනානායක ජාතික පාසලට ඇතුලත් කරගෙන ඇති බවත්, ආදි ශිෂ්‍ය ගණය හා සහෝදර පදනම මත අවම ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු සීමාව ලබා ගත් දරුවන්ද පාසලට ඇතුලත් කර ගෙන ඇති බවත් අනාවරණය වී ඇත.

නමුත් අයදුම් කළ අයදුම්කරුවන්ගෙන් ලකුණු අනුපිළිවෙල මත 04 වන ස්ථානයේ සිටින පැමිණිලිකරුගේ දරුවා සම්මුඛ පරීක්ෂණයකට හෝ නොකැඳවා අධ්‍යාන කාර්යය මණ්ඩල ගණය යටතේ පාසලේ රාජකාරී කරන ගුරුභවතුන්ගේ ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ලකුණු 130,125,108,72 ලබා ගත් දරුවන්ද පාසලට ඇතුලත් කිරීමේ ලේඛන ගත කර නිර්දේශය ලබා ගැනීමට අධ්‍යාපන අධ්‍යක්ෂ පාසල් කටයුතු ශාඛාව වෙත යොමුකර ඇති බවද අනාවරණය වී ඇත.

අතිරේක ලේකම් (අධ්‍යාපන හා ගුණාත්මක සංවර්ධන) 2017/07/07 දිනැති හා අංක ED/01/12/04/02/04 අංක දරණ ලිපියෙන් අම් /ඩී.එස්.සේනානායක ජාතික පාසලේ විදුහල්පති වෙත 2008/37(1) චක්‍රල්බ විධිවිධාන වලට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩල ගණ යටතේ සිසුන් තෝරාගැනීම සිදුකර නොමැති බැවින් එම ගණය යටතේ කලාපයේ පාසල්වලින් ඉල්ලුම් කර ඇති වැඩි ලකුණු ලැබූ සිසුන් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, විදුහල්පති එම නියෝගයට අනුව කටයුතු කර මේ දක්වා පුරප්පාඩු පිරවීම සිදු නොකර ඇති බවද අනාවරණය වී ඇත.

ඉහත කරුණු අනුව අම්/ඩී.එස්.සේනානායක විදුහලට අධ්‍යාන කාර්යය මණ්ඩල ගණය යටතේ ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් අතරින් පැමිණිලිකරුගේ දරුවා ලකුණු අනුපිළිවෙලූ අනුව හතරවන ස්ථානයේ සිටින බව අනාවරණය වන බැවින් හා මේ වන විටද එම ගණය යටතේ පුරප්පාඩු 06ක් පවතින බැවින් එම දරුවා 2008/34(1) චක්‍රලේඛ විධි විධාන අනුව පාසලට ඇතුලත් වීමට සුදුසුකම් ලබන බව අනාවරණය වේ.

වගඋත්තර පාර්ශවයේ වාර්තාවේ කරුණු හා 2017/11/29 දිනැති ED/01/12/01/01/28 දරණ ආචාර්ය මදුරා එම්.වෙහැල්ල අත්රේක ලේකම් (අධ්‍යාපන හා ගුණාත්මක සංවර්ධන)ගේ වාර්තාවේ කරුණු අනුවද අධ්‍යාපන කාර්යය මණ්ඩල ගණය යටතේ ඉල්ලුම් කර ඇති සිසුන් අතුරින් ලකුණු අනුපිළිවෙල මත 04වන ස්ථානයේ සිටින පැමිණිලිකරුගේ දරුවා එම ගණය යටතේ අම්පාර ඩී.එස්.සේනානායක විදුහලට ඇතුලත් වීමට සුදුසුකම් ලබා ඇති බව අනාවරණය වේ. විශේෂයෙන්ම අතිරේක ලේකම් අධ්‍යාපන හා ගුණාත්මක සංවර්ධන ආචාර්ය මධුරා එම්. වෙහැල්ල මහත්මියගේ අංක ED/01/12/01/01/28 හා 2017.11.29 දිනැති වාර්තාවේ, 04වන කරුණු දැක්වීම අනුව "තවද ඉහත අනුග්‍රහයක් පවතින පාසල්වලට ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු ඉක්මවූ සිසුන්ගෙන් පවතින පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ නොවන අවස්ථාවකදී 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා සිසුන් තෝරාගත හැකිය." යන පැහැදිළි කිරීම 2008/37 චක්‍රලේඛ මගින් පොදු ලකුණු ප්‍රමාණ මත ගන්නා සිසුන්ට මෙන්ම ආදී ශිෂ්‍ය, සහෝදර අධ්‍යාපන කාර්යමණ්ඩල යන පදනම් මත බඳවාගන්නා සිසුන්ට පොදුවිය යුතුය.

ඒ අනුව අම්/ඩී.එස්.සේනානායක විද්‍යාලයටද සහෝදර පදනම හා ආදී ශිෂ්‍ය පදනම මත සිසුන් බඳවා ගෙන ඇති බව හා ඒ සඳහා අනුමැතිය ලබාදී ඇති බව එහි විදුහල්පති ඉදිරිපත් කර ඇති ලේඛණ අනුව ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු 100 ලබාගෙන ඇති සිසුන්ද ඉල්ලුම් කල සිසුන්ගේ ලකුණු අනුපිළිවෙල මත බඳවාගෙන ඇති බව අනාවරණය වේ.

අධ්‍යාපන කාර්ය මණ්ඩල පදනම මත විදුහල්පති අම්/ඩී.එස්.සේනානායක විදුහල අනුමැතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති ශිෂ්‍ය ලේඛනයේද ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 72ක් ලැබූ සිසුවෙක්ද සිටීමෙන් ඉල්ලුම් කළ සිසුන්ගේ ලකුණු අනුපිළිවෙල මත බඳවාගැනීමට කටයුතු කර ඇති බව පැහැදිළි වේ. එසේ නමුත් නාමලේඛනයට පැමිණිලිකරු දැක්වූ විරෝධතාවය නිසා එය අනුමත කිරීම සිදුකර නොමැති බවද අනාවරණය වේ.

එසේ තිබියදී අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයතු) එම්.කමනි පෙරේරා මහත්මිය අංක ED/01/12/14/02/02/02 හා 2013.01.22 දිනැති වාර්තාව මඟින් 2017.11.20 දිනට පෙර අධ්‍යාපන කාර්ය මණ්ඩල පදනම යටතේ ඉල්ලුම්කර ඇති සිසුන්ගේ නාමලේඛනය නිර්දේශ කර ඉදිරිපත් කරන ලෙස විදුහල්පතිට දන්වා එම ලේඛනය නොලැබීම හේතුවෙන් සියලු පුරප්පාඩු අමාත්‍යාංශය වෙත ලැබුණු අභියාචනා වලින් පිරවීම සිදුකර ඇති බව අනාවරණය වේ. එසේ කටයුතු කිරිමෙන් 2008/37 චක්‍රලේඛ මඟින් සිය දරුවන් ජාතික පාසල් වෙත ඇතුළත් කිරිම සඳහා අධ්‍යාපන කාර්ය මණ්ඩලය වෙත ලබාදී ඇති(2.5% ක ප්‍රතිශතය) අවස්ථාව අහිමි කර ඇත.

එසේම පැමිණිලිකරු හා වගඋත්තර පාර්ශවීය අම්/ඩී.එස් සේනානායක විදුහලේ විදුහල්පති එකම ක්ෂේත්‍රයක රැකියාවල නිරත වන අය වුවද තමාට වූ අසාධාරණය පිළිබඳව පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීම හේතුවෙන් ඔහු සමඟ ද්වේෂයෙන් කටයුතු කරන බව පරීක්ෂණ අවස්ථාවේ කරුණු දැක්වීම් වලින්ද කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක් වී ඇත. එම හේතුව නිසාම අධ්‍යාන කාර්ය මණ්ඩල පදනම යටතේ අදාළ ශිෂ්‍ය නාමලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිර්දේශ සඳහා යොමු නොකිරීම චූවමනාවෙන්ම සිදු කර ඇති බවක් අනාවරණය වේ.

නිගමනය :-

මෙකී සමස්ථ කරුණු අනුව පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුළත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) 12(2) ව්‍යවස්ථාව මඟින් හිමිව ඇති නීතිය ඉදිරියේ සමානව සැලකුම් ලැබීමේ අයිතිය පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිරිදේශය :-

01. පැමිණිලිකරුගේ දරුවා වන කේ.ජී. සෙනාදි දිලාරා සිසුවිය අධ්‍යාපන කාර්ය මණ්ඩල ගණය යටතේ අම්පාර ඩී.එස්. සේනානායක විදුහලේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

02. අම්පාර ඩී.එස්. සේනානායක විදුහලේ විදුහල්පතිවරයා සිය රාජකාරිය පැහැර හැරීම සිදුකර ඇති බැවින් ඔහු සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ලැබේ.

03. අධ්‍යාපන කාර්ය මණ්ඩල පදනම යටතේ ඉල්ලුම් කර ඇති සිසුන්ගේ නාමලේඛනය නිර්දේශ සඳහා ගෙන්වා නොගෙන අභියාචනා ඉදිරිපත් කළ සිසුන්ගෙන් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමට අදාළව වගඋත්තරකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසැල් කටයුතු) එම්. කමනි පෙරේරා මහත්මියද කටයුතු කර ඇති බැවින් එම අය සම්බන්ධයෙන්ද අවශ්‍ය විනයානුකූල පියවර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පියවර ගත යුතුය.

2019. 04. 22 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/ R-4